**දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - 2016**

දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලද අතර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා චීන අපනයන ආනයන බැංකුව අතර 2014 සැප්තැම්බර් 16 සහ දෙසැම්බර් 23 සහ 2016 අප්‍රේල් 07 දින එළඹි අංක පීබීසී අංක (2014) 27 එකතු අංක (321), පීබීසී අංක (2015) 38 එකතු අංක (381) ජීසීඑල් අංක (2014) 17 එකතු අංක (520) සහ ජීසීඑල් අංක (2014) 18 එකතු අංක (521) දරන ණය ගිවිසුම් යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ.

**1.2 <u>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම සහ ව්‍යාපෘති කාලය</u>**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග හා මාර්ග සංවර්ධන සහ ඛණිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ, මාතර සිට හම්බන්තොට දක්වා දක්ෂිණ අධිවේගී මාර්ගය කිලෝමීටර් 96 ක් දීර්ඝ කිරීමට හා ජාත්‍යන්තර ආයෝජන කේන්ද්‍රයක් ලෙස හම්බන්තොට සංවර්ධනය කිරීම සඳහා සහාය හා කාර්යයන් පහසුකරලීම සඳහා මාර්ගජාලය සංවර්ධනය කිරීමයි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 311,075 සහ සිවිල් කොන්ත්‍රාත් වැඩ සහ උපදේශන සේවා සඳහා රු.මිලියන 218,438 කට සමාන එ.ජ.ඩො.මිලියන 1,708 ක් සැපයීමට චීන අපනයන ආනයන බැංකුව එකඟ වී තිබුණි. අධිවේගී මාර්ගයේ කොටස් 03 ක ඉදිකිරීම් 2016 ජනවාරි මාසයේදී හා අනෙක් කොටසේ ඉදිකිරීම් වැඩ 2016 ඔක්තෝබර්හිදී ආරම්භ කරන ලදී. එහි කොන්ත්‍රාත්තු වැඩ 2019 ජනවාරි වන විට නිමකිරීමට නියමිතව තිබුණි.

**1.3 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 <u>විගණකගේ වගකීම</u>**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් පිළිබඳ විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණන සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම පිණිස මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කල මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගතවූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව,

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව,

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව,

(උ) මගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඌ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 2.1 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව හා මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි සඳහන් කරුණුවලින් උද්ගත වන ගැලපීම් හැර මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කරගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

2016 දෙසැම්බර් 31 වන දිනට ව්‍යාපෘතියේ උපදේශකයින් හට ගෙවිය යුතු රු. මිලියන 931 ක මුදල සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

#### 2.2.2 නීති රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

මුදල් රෙගුලාසි 137 හි අවශ්‍යතාවය ලෙස ව්‍යාපෘති අධ්‍යක්ෂක හෝ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතන විසින් අනුමත නොකල රු. මිලියන 1,084 ක එකතු වූ ගෙවීම් සමාලෝචනයට භාජනය වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල උපචිත වියදම් ලෙස පෙන්වා තිබුණි.

### 3. මූල්‍ය සහ භෞතික කාර්යසාධනය

#### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුල සහ 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යායනය කිරීමට එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | 2016 දෙසැම්බර් 31 දිනට |
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| චීන අපනයන හා ආනයන බැංකුව | 1,708 | 220,042 | 40,626.60 | 31,784.80 | 46,588.70 |
| ශ්‍රී ලංකා රජය | 121 | 15,588 | 5,400.00 | 4,535.00 | 11,818.30 |
| හැටන් නැෂනල් බැංකුව | 63 | 8,181 | - | 1,785.50 | 1,785.50 |
| | 1,892 | 243,811 | 46,026.60 | 38,105.30 | 60,192.50 |

#### 3.2 භෞතික කාර්යසාධනය

මොරටුව විශ්වවිද්‍යාලය මගින් 2015 අප්‍රේල් 28 දින නිකුත් කරන ලද තාක්ෂණික විගණන වාර්තාවට අනුව, මාර්ග තීරු 4 කින් යුත් දක්ෂිණ අධිවේගී මාර්ග දිගුවෙහි කොන්ත්‍රාත් වැඩ කටයුතුවල ආර්ථික අභ්‍යන්තර ඵලදා අනුපාතය ඍණ 11.10 ප්‍රතිශතයක් ගනී. කෙසේවෙතත්, අධිවේගී මාර්ගයේ දීර්ඝකිරීම් කොන්ත්‍රාත් වැඩ කටයුතු මාර්ග තීරු 4 කින් යුක්තව කොටස් 4 ක් යටතේ බෙදා වෙන් කර ඇති අතර මාතර සිට බෙලිඅත්ත, බෙලිඅත්ත සිට වැටිය, වැටිය සිට අන්දරවැව සහ අන්දරවැව හරහා මත්තල සිට හම්බන්තොට ලෙස විදේශීය කොන්ත්‍රාත්කරුවන් 03 දෙනෙකුට 2014 වර්ෂයේදී කැමැත්තෙන් ප්‍රදානය කරන කොන්ත්‍රාත්තු ලෙස (unsolicited කොන්ත්‍රාත් පැකේජ) යටතේ ප්‍රදානය කර තිබුණි. ලබාදුන් තොරතුරුවලට අනුව, 2016 දෙසැම්බර් 31 දින වන විට අධිවේගී මාර්ගයේ කොන්ත්‍රාත් වැඩ කටයුතු මූලික අදියරෙහි පවතී. ඒ අනුව පහත දැක්වෙන නිරීක්ෂණ සිදුකරනු ලැබේ.

(අ) පොදු ලක්ෂණයක් ලෙස, කොන්ත්‍රාත් වැඩ කටයුතුවල විෂය පථය නිතර වෙනස් කර තිබුණි. එබැවින්, මාතර සිට බෙලිඅත්ත දක්වා අධිවේගී මාර්ගයේ කිලෝමීටර 6.50 සිට කිලෝමීටර 10.30 දක්වා මූලික මෝස්තරයන්හි යෝජනා කර ඇති පිරවුම් (embankments) වෙනුවට ගුවන් පාලම් හඳුන්වාදී තිබුණි. කෙසේවෙතත්, එහි පිරිවැය ඉහළයාම පිළිබඳ බලපෑම් ව්‍යාපෘතිය විසින් ගණනය කර නොතිබුණි.

(ආ) අධිවේගී මාර්ගයේ මාතර සිට බෙලිඅත්ත දක්වා කොටසේ ඉදිකිරීම් කටයුතු උපදේශනය සඳහා 2014 සැප්තැම්බර් මාසයේදී රජයේ සංස්ථාවක් වෙත ප්‍රදානය කරන ලද අතර 2015 සැප්තැම්බර් මාසයේදී එය අවසන් කරන ලදී. රු. මිලියන 24.84 ක මුදලක් වෙනත් ආධාර මුදල් ව්‍යාපෘතියක් වන උතුරු මාර්ග පුනරුත්ථාපන ව්‍යාපෘතියේ ඉතිරිවීම් මඟින් යොදාගනිමින් ගෙවා තිබුණි. කෙසේවෙතත්, සිවිල් ඉදිකිරීම් වැඩ ආරම්භ කර තිබුණේ 2016 ජනවාරි 19 වනදා වුවද උපදේශක විසින් උපදේශකවරුන්ගේ මාර්ගෝපදේශ හෝ ඉදිකිරීම් වැඩ සඳහා මාර්ගෝපදේශ කටයුතු සිදුකර නොමැති බව ඔප්පු වී ඇත.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

ව්‍යාපෘතියේ අනුමත කාර්යමණ්ඩලය තනතුරු 226 කින් සමන්විත වන අතර එක් ව්‍යාපෘති ගණකාධිකාරීවරයෙක්, ව්‍යාපෘති ඉංජිනේරුවරුන් 13 දෙනෙකුගෙන් සහ කළමනාකරණ සහකාර 36 දෙනෙකුගෙන් එය සමන්විත වේ. කෙසේවෙතත්, ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් ව්‍යාපෘති ගණකාධිකාරීවරුන් 4 දෙනෙක්, ව්‍යාපෘති ඉංජිනේරුවරු 13 දෙනෙක් සහ කළමනාකරණ සහකාර 36 දෙනෙක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබානොගෙන අමතරව බඳවාගෙන තිබුණි.

## 3.4 මතභේදයට තුඩු දෙන කරුණු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉඩම් අත්පත් කරගැනීම් හා නැවත පදිංචි කිරීමේ උපදේශකවරුන් 13 දෙනෙක් සඳහා 2016 දෙසැම්බර් 31 වන විට වැටුප එකතුවූ රු. මිලියන 386.67 ගෙවා තිබුණ ද මත්තල සිට හම්බන්තොට දක්වා වූ අධිවේගී මාර්ගයේ කිලෝමීටර 8+250 සිට කිලෝමීටර 8+500 දක්වා කොටසෙහි දිග මීටර් 40 ක් හා ගැඹුර මීටර 23 ක් ගල් වලක් මූලික ඉඩම් මැනීම්වලදී හඳුනාගෙන නොතිබුණි. පසුව ගල් වල පිරවීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 380.66 ක් ව්‍යාපෘතිය විසින් තීරණය කර තිබුණි.

(ආ) මාතර සිට බෙලිඅත්ත කොටසෙහි දිග මීටර 41,970 ක් සඳහා ගැවල් කම්පැක්ෂන් පයිල් (Gravel compaction pile) පරීක්ෂාවක් සිදුකර එය අසාර්ථක වී තිබියදීත් රුපියල් මිලියන 266.61 කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) කොන්ත්‍රාත්තුවේ පොදු තත්ත්වයන්හි 4.2 වගන්තියට පටහැනිව ව්‍යාපෘති විසින් එකතුවූ රු. මිලියන 128.42 ක් කාර්යසාධන බැඳුම්කර ලබාගැනීමේ පිරිවැය සඳහා වියදම් කර තිබුණි.

(ඈ) කොන්ත්‍රාත් ගිවිසුමෙහි ප්‍රමාණපත්‍රවල අංක 103(2) අනුව, කොන්ත්‍රාත්කරුන්ට ආනයන කරනු ලබන යන්ත්‍ර සහ උපකරණ නැවත අපනයනය කිරීමට අවසර ලබාදී තිබුණි. කෙසේවුවත්, කොන්ත්‍රාත්කරුවන් විසින් නැවත අපනයනය කිරීමට බලාපොරොත්තු වන යන්ත්‍ර සහ උපකරණ හඳුනාගැනීම සඳහා කිසිඳු යාන්ත්‍රණයක් හඳුන්වාදී නොතිබුණි.

## 3.5 ඉඩම් අත්පත්කරගැනීමේ කටයුතු පිළිබඳ ගැටළු

විගණනයට ඉදිරිපත් කරන තොරතුරු අනුව, 2014 මැයි 21 දින ආරම්භ කරන ලද ඉඩම් අත්පත්කරගැනීමේ කටයුතු 2014 නොවැම්බර් 19 දින නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවුවත්, මාර්ග සංවර්ධන අධිකාරියේ ඉඩම් අත්පත් කරගැනීමේ අංශය විසින් දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව අංශයට අදාල අත්පත් කරගත් ඉඩම් කැබලි පිළිබඳ කිසිඳු වාර්තාවක් පවත්වාගෙන නොතිබුණි.

## 3.6 මූල්‍ය පාලනය පිළිබඳ ගැටළු

මුදල් රෙගුලාසි 454 සහ 751 අනුව නඩත්තු කළ යුතු ස්ථාවර වත්කම් ලේඛනය ව්‍යාපෘතිය විසින් නියමාකාරයෙන් නඩත්තු කර නොතිබුණි.